499 A නියදගල

පරිසර සම්පත් පැතිකඩ

ජී.එම්.සී. චාන්දනි

1.හැඳින්වීම

(a) වසම හා අංකය- 499 A නියදගල

(b) වපසරිය - වර්ග කිලෝ මීටර් -1.35

හෙක්ටයාර් 135

අක්කර 333.585

(c) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය -හෝමාගම

(d) ගොවිජන හා කෘ.ප.නි. ස කොට්ඨාසය - කහතුඩුව/මාගම්මන

(e) සෞ.වෛ.නි. කොට්ඨාසය -කහතුඩුව

(f) පශු වෛද්‍ය නිලධාරි කා. කොට්ඨාසය -හෝමාගම

(g) බීට්ටු වන නිලධාරි කාර්යාල කොට්ඨාසය -කළුතර

(h) අඩවි වන **නිලධාරි කාර්යාල කොට්ඨාසය - වග**

(i) වාරිමාර්ග **ඉංජිනේරු කොට්ඨාසය - හෝමාගම**

(J) වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසය - කොළඹ

11. ජනගහනය - 4596

ස්ත්‍රී - 2460

පුරුෂ - 2136

(උපුටා ගැනීම 2024-2025 වසමේ සම්පත් පැතිකඩ)

III. ජනාවාසකරණයේ ස්වභාවය - අර්ධනාගරික

IV.දේශගුණික තොරතුර

a) අක්ෂාංශ හා දේශාංශ ගත පිහිටීම - දේශාංශ 80

-අක්ෂාංශ 6.84

(b) උෂ්ණත්වය සාමාන්‍ය - 30.68 c

උපරිම - 32 c

අවමය - 29.8 c

(c) වර්ෂාපතනය - 390 mm

(d) සාපේක්ෂ ආර්ද්‍රතාව - 33 %



(v) පාංශු තොරතුරු

a) පසේ ස්වභාවය - වැලි පස

b) පසේ වර්ගය - රතු කහ පොඩ්සොලික්

c) සුලබ පාෂාණ ස්ථිත්වය - ග්‍රැනයිට්

2.පරිසර සම්පත් පැතිකඩක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය

1.සම්පත් පිළිබඳව සමාලෝචනය කිරීම

II තිරසාර සම්පත් භාවිතාව හා කළමනාකරණය කිරීම

III පාරිසරික ගැටලු හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් යෝජනා කිරීම

iv පරිසර කළමනාකරණයෙහිලා ප්‍රජාවේ දායකත්වය, සහභාගිත්වය හා අවබෝධය පුළුල් කිරිම.

v) සංවර්ධන යෝජනා හඳුනාගැනීම හා පරිසර ශක්‍යතා සමාගම් කිරීම

vi) ආපදා අවධානම් හඳුනාගැනීම හා බලපෑම අවම කරගැනීම

vii අඛණ්ඩව මෙහෙයුම්කරණය, අධික්ෂණය හා ඇගයීම ස්ථාපිත කිරිම

3.ස්වාභාවික සම්පත් පැතිකඩ

i භෞමික සම්පත්

a) වපසරිය /භූමි ප්‍රමානය

වර්ග කිලෝ මීටර් -1.35

හෙක්ටයාර් 135

අක්කර 333.585

b) භූමි පරිහරණ සැලසුම

කෘෂිකාර්මික කටයුතු සඳහා භූමි පරිහරණය

I. වී - හෙක්ටයාර් 24.8

ii. වෙනත් ධාන්‍ය බෝග වගාව- වසමට අදාල නොවේ

III. අපනයන කෘෂි භෝග- වසමේ නොමැත

- Iv. භූමි යෙදවුම්

1. ගොඩ ඉඩම් 104.8
2. මඩ ඉඩම් හෙක්ටයාර් 24.8
3. පුරන් වූ/ අත් හැර දැමූ- හෙක්ටයාර් 5.



c). පසේ ස්වභාවය හා සාපලාාතාව- වැලි සහ බොරළු ලෝමපස

d). පාශු ඛාදනයේ ස්වභාවය - නොමැත

e). පාංශු හායනය ස්වභාවය - නැත

ii ජලජ සම්පත්-

a) මතුපිට ජල මූලාශ්‍ර

- ගංගා - නැත
- අතු ගංගා / ඔය දොළ - නැත
- ඇළ මාර්ග-පුංචි පිටකොටුව ඇළ , ගොරක ගහ කුඹුර යාය ඇළ, හල් අත්ත ගොඩදෙනියේ ඇළ, හීං ඇළ ,මහ ඇළ, රිටිගහයාය දෙනියේ ඇළ
- වැව් /තටාක - අදාල නැත
- පොකුණු/නිර්මිත පොකුණු- නියදගල වසමේ නොමැත

දිය උල්පත් - නැත

b) භූ ගත ජලය

- ළිං නියදගල වසම තුල ළිං 285 ක් පවති
- නළ ළිං - නොමැත

(උපුටා ගැනීම 2024-2025 වසමේ සම්පත් පැතිකඩ)

c) වර්ෂාපතනය

- වාර්ෂික මධ්‍යනය- 280 m.m
- වර්ෂා ක්‍රමය - සංවහන , නිරිත දිග හා ඊසාන දිග මෝසම්

d) වාරිමාර්ග කටයුතු-

- මහා වාරී ව්‍යාපාර- වසම තුල නොමැත}
- සුලු වාරි ව්‍යාපාර - වසම තුල නොමැත

e) ජලයේ ගුණාත්මක බව - PH අගය 6.5-75- ළිං වල PH අගය 7 ට ආසන්න අගයක් ගනියි

පානිය ජලය මිනිසාගේ පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය වන වර්ණයකින් තොර ගඳ සුවඳකින් තොර සහ විශේෂ රසායනයකින් තොර වූවක් විය යුතුය.එහෙත් මෙම වසමේ කර්මාන්ත ශාලා වැඩි ප්‍රමාණයක් පවතින අතර එහි අපද්‍රව්‍ය ඇළවල් වලට මුදා හැරීම තුළින් භූ ගත ජල පද්ධතිය (ළිං ජලය) සෞඛ්‍යාරක්ෂිත නොමැතිවීමේ ගැටලුවක් පවතිනු ඇතැයි මතයක් ව්‍යාප්තව ඇත.ඇතැම් ළිං වල ජලය පරීක්ෂා කිරීමේදි සෞඛ්‍යාරක්ෂිත නොවන වග තහවුරු වී ඇත. මේ නිසා පවුල් කිහිපයක් මේ වන විට බෝතල් ජලය පානය කිරීම සඳහා යොමු වී ඇත.

f) ජල සුලබතාව -

මෙම වසමේ පවුල් වලින් 75% ජාතික ජල සම්පාදන මණ්ඩලයේ ජලය භාවිතයටගනී.එමෙන්ම කර්මාන්තශාලා හා ව්‍යාපාර ආයතන ද නළ ජලය මගින් ජල අවශ්‍යතා සපුරාගනි.
මෙම වසමේ පවුල් වලින් 25% ළිං ජලය භාවිතා කරයි. දැඩි නියං තත්ත්වයකදි පමණක් ළිං ජලය සිදී යාමක් දක්නට ලැබේ.
පොදුවේ භාවිතයට ගන්නා පොදු ළිං 04 ක් පමණ තිබෙන අතර එම ජලය පානය සඳහා භාවිතයට නොගනී . මෙම වසමේ ජල හිඟතාවයක් මෙතෙක් වාර්තා නොවේ.

(උපුටා ගැනීම 2024-2025 වසමේ සම්පත් පැතිකඩ)

iii. වනාන්තර හා වන වගාවන්

a) වන වැස්මේ ව්‍යාප්තිය- නියදගල වසම තුල වන වැස්මක් නොමැත.

b) සුලබ ශාක පිළිබඳ ලේඛණය

පොල්	කොස්	පුවක්	අඹ	රඹුටන්	කෙසෙල්	දෙල්	කොහොඹ	මුරුංගා	කතුරු මුරුංගා	ග්ලිරයිසීන
540	84	341	601	98	587	48	35	200	56	1201

දොඩම්	දෙහි	බෙලි	ගස් ලබු	ඇඹරැල්ල	පේර
96	116	84	289	278	168

c) දැවමය නොවන වන නිෂ්පාදන

- ආහාර සහ ආකලන - ගම්මිරිස්,කහ.ඉගුරු **සේර කුරුඳු,** පොල්, පුවක්,
- දේශිය ඖෂධ - නිල් කටොරොලු, කෝමාරිකා, අක්කපාන, පාවට්ට, හීන් බෝවිටියා **හාතවාරිය පොල්පලා, ගොටුකොළ,වද,යකි නාරං, ඇපල**
- ශාකසාර - නැත
- අත්කම් අමුද්‍රව්‍ය - උණ
- ඉදිකිරීම් අමුද්‍රව්‍ය - පොල්, පුවක්, කොස්,අඹ
- ± සැරසිලි හා සංස්කෘතික වටිනාකමක් සහිත ද්‍රව්‍ය - පිහිබියා, ඇකේෂියා, ක්‍රෝටන්,

දිව්‍ය ඖෂධයක්
Saheli
බෙලි

Search inside image



රසකිඳ
Fruits

කොබෙයිගනේ
ඇපල
©℗© කොබෙයිගනේ පාරම්පරික ඔසු

d) වන විනාශකිරීම් පිළිබඳ විස්තරය- වාර්තා වී නොමැත.

e) වන වගා ව්‍යාපෘති විස්තරය - වාර්තා වී නොමැත.

f) වන සංරක්ෂණ ප්‍රයත්නයන්

- ප්‍රජා වැඩසටහන්- නැත
- රාජ්‍ය /රාජ්‍ය නොවන/ස්වෙච්ඡා සංවිධාන මගින්- නැත

IV. ජෛව විවිධත්වය

a] ශාක ලේඛනය (විශේෂ වශයෙන්) - බුරුත 03

b) ශාඛ වර්ගීකරණය (දේශිය/ඒක දේශිය හදුන්වාදුන් විදේශිය හෝ දේශිය, ස්වාභාවි කෘත විදේශිය හො දේශිය/ ආගන්තුක/ ආගන්තුක- ආක්‍රමණශීලි-

දේශීය ශාක	ඒක දේශීය	හදුන්වාදුන් විදේශීය/දේශීය	ස්වාභාවික දේශීය හො විදේශීය	ආගන්තුක ශාක	ආක්ක්‍රමණශීලී ශාක
කොහොඹ	හීං බෝවිටියා	ඇකේෂියා	නැත	නැත	ගදපාන
බුරුත	කැකුණ				
කදුරු	ගොඩපර				
කොස්					
වෙරලු					
ගිරිතිල්ල					
මුරුංගා					
හල්					

c) අන්තරායට ලක් වූ කාණ්ඩ-

4) පරිසරය හා සම්බන්ධ මානව ක්‍රියාකාරකම්

1. කෘෂි කර්මය

(a) ප්‍රධාන භෝග (වී)

වසම තුල හෙක්ටයාර් 24.8 ක් භූමි වපසරියක් තුල වී වගාව ව්‍යාප්තව ඇත.එය මුළු භූමි ප්‍රාමණයෙන් 18% ක් පමණ වේ.වී වගාවේ නිරත ගොවී පවුල් 92 ක් නියදගල ග්‍රාම නිළධාරි වසමේ ජීවත් වේ.

(b) අතිරේක භෝග- නොමැත

(c) අපනයනය භෝග (තේ, පොල්, රබර්)- තේ සහ රබර් වසම තුල වගා කර නොමැති අතර පොල් හෙක්ටයාර් 2 ක් පමණ ව්‍යාප්තව ඇත.

[d] සුලු අපනයන බෝග / අපනයන කෘෂි බෝග (ඇමුණුම් 01) -කහ. ගම්මිරිස් සුළු වශයෙන් ඇත.

බෝග වර්ගගය	අක්කර ප්‍රමාණය
ගම්මිරිස්	0.60 (පර්චස්)
බුලත්	0.40 (පර්චස්)
ඉඟුරු	0.20 (පර්චස්)
කහ	0.10 (පර්චස්)

(e) වෙනත් වාණිජ බෝග (පාම් /අගාවුඩ් ආදිය) අදාල නැත

(f) රසායනික පොහොර යෙදවුම් (ප්‍රස්තාර සහිතව) වී වගාව සඳහා රසායනික පොහොර පමණක් භාවිතා කරන අතර පොල් වගාව සඳහා ද රසායනික පොහොර භාවිතය වැඩිවෙමින් පවති. අනෙකුත් වගාවන් සඳහා ද රසායනික පොහොර භාවිතා කිරීමේ නැඹුරුව වැඩි වෙමින් පවති.



(දත්ත ලබා ගැනිම- ගොවි පවුල් 30 ක් යොදාගෙන කරණ ලද සමීක්ෂණය මගිනි)

[g] කෘමි පළිබෝධ නාශක යෙදවුම් (ප්‍රස්තාර) සහිතව



(දත්ත ලබා ගැනීම- ගොවි පවුල් 30 ක් යොදාගෙන කරණ ලද සමීක්ෂණය මගිනි)

(h) සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් -

කෘෂිකාර්මාන්තය යනු විද්‍යාව, කළාව, කර්මාන්ත ළමනාකරණය , ශාක වගාව සහ මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා සතුන් ඇති කිරීම ඇතුලු ක්‍රියාදාම සමුහයක එකතුවකි. නියදගල වසමේ ජනාවාසකරණය විමට පෙර බහුල වශයෙන් කෘෂිකාර්මාන්ත කටයුතු ව්‍යාප්ත වී පැවතියද වර්තමානය වන විට එය විශාල ලෙස අඩු වෙමින් පවතී.වර්තමානය වන විට කුඹුරු ආශ්‍රිත ඕවිටවල එළවලු ඇතුළු වගාවන් සුළු පරිමානයෙන් වගා කරනු ලබයි. සාම්ප්‍රදායික කෘෂිකාර්මන්තය තුල ඔහුන් විසින්ම තහවුරු කරගත් විශ්වාස හා ඇදහිලි මත පැවත ආ ක්‍රම වේදයන් සුලභ වශයෙන් දක්නට ලැබේ. ආගම සංස්කෘතික ,හා දෙවියන් පිළිබද මනසේ ගොඩනගාගත් පාරම්පරික ඥානයෙන් ලද උරුමයන් ලෙස සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රම වේද ඔහුන් විසින් ගොඩ නාගාගෙන ඇත

I) නවීන කෘෂිකාර්මික පිළිවෙත්

සාම්ප්‍රධායික කෘෂිකාර්මික පිළිවෙත්	නවීන කෘෂිකාර්මික පිළිවෙත්
මී හරක් යොදාගෙන කුඹුරු හෑම සහ මිනිස් ශ්‍රමය යෙදාගෙන බිම් සැකසීම	බිම් සැකසීම සඳහා පස සැකසීමේ බුරුලු කිරීමේ යන්ත්‍ර භාවිතය
ගොයම් පැළ අතින් සිටුවීම හා කන්න අතර අතුරු භෝග වගාව සිදුකිරිම	බීජ ඉසීමේ යන්ත්‍ර භාවිතය
ගොවින් එකට එකතු වී යායෙ ගොවිතැන් කටයුතු එක්ව සිදුකිරිම	අස්වනු නෙලීම සඳහා ට්සුනාමි යන්ත්‍රය භාවිතය
දෑ කැති භාවිතයෙන් ගොයම් කැපීම සහ අස්වනු නෙලීම සඳහ මිනිස් ශ්‍රමය භාවිතා කිරිම	රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය
අලුත් සහල් මංගල්ලය	
සාම්ප්‍රදායික අද ක්‍රමය	
කාබනික පොහොර භාවිතය	

වර්තමානයේ දක්නට නොමැති වුවත් බෝහෝ ජනාවාස ඉදිවිමට ප්‍රථම හේන්ගොවිතැන වසම තුල තීතයේ තිබූ බවට පැරන්නන් විසින් පවසයි.කැළෑ එළිකර පසුව ගිනි තබා නැවුම් පසේ සරුවට ,අල, බතල, මිරිස්, එළවළු ඇතුලු වගාවන් සිදු කර ඇත. යළ හා මහ කන්නයේ වර්ෂාපතනයන්ට අනුවර්තනය වන පරිදි සාම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු සිදුකොට ඇත

කොළපාට නයි මිරිස්

J) යහපත් කෘෂිකාර්මික පිළිවෙත්(GAP)- මෙම සහතිකය ලබාගත් ගොවීන් වසම තුළ නැත.

(K) කෘෂිකාර්මාන්තය කෙරෙහි වන අභියෝගතා හා දුෂ්කරතා (ස්වාභාවික ආපදා/කෘමි හා පළිබෝධ බලපෑම්)

1. මෙම වසමේ වී වගාවේ යෙදෙන මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ පැවත හා කාළගුණයන් ගේ වෙනස්වීම් නිසා වගාවන්ට සිදුවන හානියයි.
අස්වනු නෙලන සමයේ අනපේක්ෂිතව සිදුවන මහ වැසි සහ පැළ හා බීජ සිටුවන කාලයේ සිදුවන අනපේක්ෂිත වියළි කාලගුණය
2. අපේක්ෂිත අස්වනු ආදායම නොලැබීම සහ අධික ලෙස ගොවිතැන් කටයුතු සඳහා යන මුදල් වියදම්
3. ඇතැම් ස්ථාන වල පවතින ගැඩුරු බව හා ගිලීමේ ප්‍රවනතාව වැඩිවීම හේතුවෙන් කුඹුරු හැම සඳහා යන්තෝපකරණ භාවිතා කළ නොහැකි වීම
4.පුහුණු මිනිස් ශ්‍රමයේ හිගකම
5.පොල්වගාව සඳහා රතුකුරුමිනියගෙන් සිදුවන හානි , කොල සුදු විමේ රෝගය මෙන්ම වදුරන් වැනි සතුන් මගින් සිදු කරනු ලබන අස්වනු විනාශය
6.මිරිස් එළවළු ඇතුළු වගාවන් සඳහා බෝවෙන දිලීර රෝග

II පාශු සම්පත් කර්මාන්තය

a) සුලබ පශු කර්මාන්තයේ යෙදවුම්

b) පශුකරමාන්තය සඳහා යෙදෙන ආහාර පිළිබඳ විස්තර (ස්වාභාවික, කෘතිම, මිශ්‍ර)

සුලබ පශු කර්මාන්ත යෙදවුම්

	ප්‍රමාණය	සත්ත්ව වර්ගය	යොදා න්නා කාර්යය	හිමිකරුවන් ගණන	ඇති කිරීමේ ක්‍රමය	ආහාර
එළ ගව	12	සහිවාල්	කිරි	04	නිදැලි	ස්වාභාවික,
එළුවන්	6		කිරි	1	නිදැලි	ස්වාභාවික,
කුකුළු	160		බිත්තර	03	නිදැලි	ස්වාභාවික,
වෙනත් (තිරික්කල් තරඟ සඳහා යොදාගන්නා ගවයින්)	4		වෙනත්	01	අඩසියුම් ක්‍රමය	ස්වාභාවික,

(c) පශු වෛද්‍යමය සාධක

ඉතාමත් කලාතුරකින් ගවයින් සඳහා පශු වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවී ඇත.

iii ධිවර කර්මාන්තය

(a)ප්‍රධාන ධිවර අයිතම (මත්සය වර්ග) වසමේ නොමැත

(b) ධිවර කාර්මික පරිවාර (සාම්ප්‍රදායික බිලී බෑම/ දැල් දැමීම/ නවින ක්‍රම ආදිය) - අදාල නැත

(c) ධිවර කර්මාන්තය කෙරෙහි වන අභියෝගතා හා දුෂ්කරතා - අදාල නැත

Iv ශක්ති ප්‍රභව.

- . පුනර්ජීවන ශක්ති ප්‍රභව (Renewable Energy Sources):

වසම තුල පුනර්ජීවන ශක්ති ප්‍රභව ලෙස සෝල පැනල් 64 ක් පමණ සවිකර ඇත.

- **පුනර්ජනනීය ශක්ති ප්‍රභවයන්ගේ දැකිය හැකි මූලික ලක්ෂණ**

- පරිසර හිතකාමී
- දූෂණය අඩු
- තිරසාර ලෙස පවත්වාගෙන යා හැකි

සැපයුම /ඉලලුම



- පුනර්ජීවන නොවන ශක්ති ප්‍රභව (Non-renewable Energy Sources):

මෙවා භාවිතා කිරීමෙන් පසුව නැවත ඉතා දිගු කාලයකට පසුව පමණක් සාදාගත හැකි හෝ නොහැකි ප්‍රභව වේ. **පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව නියදගල වසම තුල** ඩීසල්,පෙට්‍ට්‍ර , ගෑස් **හා දර භාවිතය සිදු වේ.**

ඉලලුම/ සැපයුම



(b) ස්වාභාවික ශක්ති සම්පත් කෙරෙහි වන ඉල්ලුම සැපයුම අනුපාත විශ්ලේශණය

1. ඉල්ලුම

- ජනගහණය වැඩිවීම: ජනතාවගේ සංඛ්‍යාව වැඩිවීමෙන් විදුලිය, බොර තෙල්, ගෑස් ආදිය සඳහා ඉල්ලුම වැඩි වේ. මූලික වශයෙන් සිදුවන කාර්මීකරණය තුළින් කර්මාන්ත ප්‍රවාහනය නව තාක්ෂණය සඳහා වැඩි බලශක්තියක් අවශ්‍යවේ.එමෙන්ම ජීවන තතතවය පහසු කිරීම සඳහා යොදාගන්නා ගෘහ උපකරණ, වාහන, AC, ටෙක්නොලොජි භාවිතය වැඩිවීමත් සමඟ ඉල්ලුම ඉහළ යයි.

2. සැපයුම

- පුනර්ජීවන නොවන ශක්ති සම්පත් සීමිතයි: ගල් අඟුරු, තෙල්, ගෑස් වැනි ප්‍රභව අවසන් වන මට්ටමට ළඟා වී ඇත. විකල්ප බල ශක්ති තාක්ෂණික සීමා පැවතීම, ආයෝජනය හා නිෂ්පාදනය සිදු නොවීම විශාල අර්බුධයකි. –
විකල්ප ශක්ති උත්සාහයන් – විදුලි සූර්ය පැනල, විදුලි වාහන, ජෛව ඉන්ධන

- 3. අනුපාත විශ්ලේෂණය - ඉල්ලුම > සැපයුම – වැඩිම සටහන.

නිගමනය:
- ස්වාභාවික ශක්ති සම්පත් සඳහා ඉල්ලුම වේගයෙන් ඉහළ යමින් පවතී.
- සැපයුම සීමිත නිසා දූෂණය, මිල ඉහළ යාම සහ විකල්ප උත්සාහ අවශ්‍ය වේ.
- තිරසාර ශක්ති සැලසුම් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයි. සෝල සැපයුම

	2005	2010	2015	2020
පුනර්ජීවන නොවන ශක්ති සම්පත්	2	4	6	10
පුනර්ජීවන ශක්ති සම්පත්	.25	.5	.75	1

ඉලලුම/ සැපයුම

ඉලලුම/ සැපයුම



(c) පුනර්ජනනීය ශක්ති ප්‍රභව සඳහා ප්‍රජාවේ දායකත්වය -

මෙම ඇත්තෙ සෝල පැනල් පමනි. ඒ සඳහා ඇති කැමත්ත හා සූදානම වැඩි වෙමින් පවති.

5 සමාජ- සංස්කෘතික සන්දර්භය

i. පරිසර ගැටලු පිළිබඳ ප්‍රජාවේ අවබෝධය හා විසඳුම් යෝජනා කරණ යන්ත්‍රණය

මෙම වසමට අදාල පරිසර ගැටලු

- කසල කළමනාකරණය සඳහා විධිමත් යාන්ත්‍රනයක් නොමැති විම
- ගෘහස්ථ හා කර්මාන්ත වල කසල වෙන් නොකිරීම
- කසල ගොඩවිම නිසා වායු දූෂනය හා මැසි මදුරුවන් අධික විම
- ඉඩම් කැබලි කර විකිනීම සඳහා පොල් සහ රඹර් වගා බිම් යොදා ගැනිම.

- ජලය බැස යන කාණු පද්ධතිය හා සුළු වාර්මාර්ග නිසි අයුරින් නඩත්තු නොකිරීම සහ පිළිසකර නොකිරීම

විසඳුම්

- අපද්‍රව්‍ය පොදු ස්ථාන වලට හා වෙනත් අනවසර ස්ථානවලට බැහර කිරීම වළක්වාලීම සඳහා රජයේ නිලධාරීන් මැදිහත් වීම මත නීතිපද්ධතිය බලාත්මක කිරීම
- clean ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ කසල කළමනාකරණය පිළිබඳව ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවත්වීම
- විථී පවිත්‍රකරණය සඳහා ප්‍රජා සහභාගිත්වය දායක කර ගැනිම සඳහා **වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම

ii) සාම්ප්‍රදායික පරිසර දැණුම හා පරිවාර

මෙම වසමේ වසර ගණනාවකට ඉහත සිට පැවත එන ,

- පරම්පරාවෙන් පරම්පරාවට බෙදා ගත් පරිසර සම්බන්ධ දැනුම
- වනයේ වටිනා ශාක, සත්ත්ව, කාලගුණ පදනම් වූ අවබෝධය මෙන්ම සිරිත් විරිත් එකතු වී සාම්ප්‍රධායික පරිසර දැනුම ගොඩනැගී ඇත.

පරිවාර

- පරිසරය රැක ගැනීමේ වගකීමක් ලෙස සළකා වගකීම් භාරගැනීම
- උදා: වල්ජීවීන්ගේ වාසස්ථාන රැකීම, විශේෂිත ගස් කපන හැකියාව සීමා කිරීම
- "පරිසරය දෙවියන්ගේ වස්තුවක්" ලෙස සැලකිල්ල

a). ජනප්‍රවාද

b]. ජනශෘතිය

499 A නියදගල ග්‍රාම නිලධාරී වසමේ ඓතිහාසික පසුබිම් කතාව කෝට්ටේ රාජධානි සමයේ පටන් පැවත එන්නකි. පාරම්පරික ගොවි පරම්පරාව මෙහි වාස භූමිය කර ගනිමින් ජීවත් වී ඇතැයි ජනප්‍රවාද වල සඳහන් වේ.

නියදගල යන නම සැදී ඇති ආකාරය පුරාන ජනකථා වල පවතින්නෙ, නිය යන්නෙන් සඳහන් වන්නෙ සෙරීනා නමින් හදුන්වන බෝගයක් හෝ මල් වර්ගයක් බහුල වශයෙන් මේ ප්‍රදේශය තුල ව්‍යාප්තව පැවති අතර බ්‍රාහ්මණගම කන්දේ ඇති විශාල ගල් පර්වතය ආසන්නයේ මේ ගම පිහිටි බැවින් ගල යන්න එකතු වි “නියදගල” යන නම පටබැදී ඇති බව පැවසේ

C). දේශීය වෛද්‍ය ක්‍රම

නියදගල ග්‍රාම නිළධාරි වසමේ ඈත අතීතයේ සිට දේශිය හෙල වෙදකම පැවත එනු වර්තමානය වන විටත් හෙල වෙදදුරන් තිදෙනෙකු රෝගීන් සඳහා ප්‍රතිකාර කරනු ලබයි.

(iii) සාම්ප්‍රදායික ජන කණ්ඩායම් සහ පරිසර අභිවරණය

අදාල නොමැත

(iv) පාරිසරික ගැටළු සඳහා යෙදුනු විසඳුම් / විකල්ප

1. කාබනික පොහොර පමණක් භාවිතා කර තිබීම
2. සරල ජීවන තත්ත්වයක් හුරු වී තිබීම

6. කාලීන පාරිසරික අර්බුද හා අභියෝග

1. වන විනාශය/කැලෑ එළි කිරිම -අදාල නො වේ.
II. ජල හිගය- දැඩි නියන් තත්ත්වයකදි ලිං ජලය සිදී යාමක් සිදු වේ.
III. පාංශු හායනය - අදාල නො වේ.
IV. කැසි කසල බැහර කිරීම
නියදගල ග්‍රාම නිලධාරීන් වසම තුල හා ආසන්නයේ කුඩා , මධ්‍යම හා මහා පරිමාන කර්මාන්ත ශාලා රාසියක් පවතින අතර රැකියා උත්පාදන අවස්ථා නිසා නිරන්තරයෙන් ජනයා සංක්‍රමනික විම දක්නට ලැබේ.ඉතා කුඩා භූමි ප්‍රාමණයක විශාල ජනග්‍රහනයක් වාසය කිරිම ආදි හේතුන් ද හේතුවෙන් අවධිමත් ලෙස පාරවල් දෙපස හා වගා නොකරන පුරන් කුමුරු ආශ්‍රිත ප්‍රදේශවල කැලි කසල බැහර කර තිබිම නිරන්තයෙන් දකනට ලැබේ. එය විශාල ගැටලුවකි .

V. දේශගුනික විපයීාස වල බලපෑම
. මිහිතලය මත මිනිසා විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකිරකම් හේතුවෙන්වායුගෝලයේ සිදු වන උෂ්ණත්වය අර්ධතාවය වර්ෂණය, වායුපීඩනය,සුළං හා වලාකුළු ආවරණය වෙනස්වීමයි. බරපතල ලෙස සිදුවන දේශගුණ විපර්යාස නිසා නියදගල වසමේ කෘෂිකාර්මික කටයුතු සඳහා ද අහිතකර බලපෑම් ඇති කල හැකියි.

vi. ආගන්තුක හා ආගන්තුක ආක්‍රමණය ශීලි විශේෂ වල බලපෑම - නොමැත.

07 පාරිසරික තිරසර සංවර්ධන අභිමතාර්ථ සපත කරගැනීම

I.අභිමතාර්ථ 06 පිරිසිදු ජලය ලබාදීම සනීපාරක්ෂක

ජලය ජීවිතයටම අත්‍යවශ්‍යය. එය සුරැකීම සහ නිසි පරිදි බෙදා හැරීම අභිමතාර්ථය, අප සැමගේ වගකීමක්ව පවතී.සියළුම සත්ත්වයින්ට පානිය ජලය ජීවත්වීම සඳහා අත්‍යවශ්‍ය අතර මිනිසුන් විසින් පානය කරනු ලබන ජලය සෞඛ්‍යාරක්ෂිත බව තහහුරු කළ යුතුව ඇත.එහෙත් නාගරිකරණයට සීඝ්‍රයෙන් යොමු වන නියදගල ග්‍රාම නිළධාරි වසම තුළ පර්චස් 10,8,7 වැනි කුඩා ඉඩම් කැබැලි වල නිවාස ඉදිකිරීම් කර ඇත.ඒවායේ ළිං සහ අපද්‍රව්‍ය මුදා හරින වලවල් නියමිත ප්‍රමිතියෙන් තොරව ඉදිකර තිබිම පිරිසිදු ජලය නොලැබීම මෙන්ම සනීපාරක්ෂාවට තර්ජනයක් වේ. නියදගල වසමේ කර්මාන්ත ශාලා මගින් ඇලවල් වලට මුදාහරින් අපද්‍රව්‍ය හේතුවෙන් ළිං ජලය පරිහරණය කරණ පිරිස්ගේ සෞඛ්‍ය තත්වයන්ට අයහපත් ලෙස එය බලපානු ඇත. පානිය ජලය මිනිසාගේ පැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය වන වර්ණයකින් තොර ගඳ සුවඳකින් තොර සහ විශේෂ රසායනයකින් තොර වූවක් විය යුතුය.එහෙත් නියදගල වසමේ කර්මාන්ත ශාලා වැඩි ප්‍රමාණයක් පවතින අතර එහි අපද්‍රව්‍ය ඇළවල් වලට මුදා හැරීම තුළින් භූ ගත ජල පද්ධතිය (ළිං ජලය) සෙඛ්‍යාරක්ෂිත නොමැතිවීමේ ගැටලුවක් පවතිනු ඇතැයි මතයක් ව්‍යාප්තව ඇත.ඇතැම් ළිං වල ජලය පරීක්ෂා කිරීමේදි සෞඛ්‍යාරක්ෂිත නොවන වග තහවුරු වී ඇත. මේ නිසා පවුල් කිහිපයක් බෝතල් ජලය පානය කිරීම සඳහා ද යොමු වී ඇත

- විසඳුම් සහ අභිමතාර්ථ

- සියළු දෙනාට ආරක්ෂිත, පිරිසිදු ජලය ලබා **ගැනීම** සඳහා ළිං වැනි ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම
ජල පිරිපහදුන පද්ධති ස්ථාපනය කිරීම
. ජලය ඉතිරිකිරීම සහ හිතකාමී භාවිතය
- ජලය වියදම් කිරීම අවම කිරීම
- වගා ක්ෂේත්‍රවල drip irrigation වැනි ක්‍රම යෙදවීම
-මිනිස් ජල භාවිතයට සීමා සහ පාලනය
- ජනතාවට ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ අවබෝධය දීම
- පාසල් මට්ටමින් පිරිසිදු ජල භාවිතයේ වැදගත්කම උගන්වීම

- සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය:

නියදගල වසම තුල සනීපාරක්ෂක පහසුකම් සාමාන්‍ය මට්ටමක පවතින අතර ප්‍රසස්ථ මට්ටමට ලගා විමට නිශ්චිත සැලසුමක් තුල වසමේ සියලුම ආයතන හා පාර්ශවයන්ට පුහුණුව සහ අවබෝධය ලබාදිය යුතු වේ ගෘහස්ථ අපද්‍රව්‍ය මෙන්ම ආයතනික වාණිජ හා කර්මාන්ත අපද්‍රව්‍ය සුරක්ෂිත කළමනාකරණය මෙන්ම ඒවායෙ සුරක්ෂිත එක් රැස් කිරිම, පිරිපහදු කිරීම්, බැහර කිරීම් හා ඒ ආශ්‍රිත සියලු පිලිවෙත් සනීපාරක්ෂාව ලෙස සළකණු ලබයි.රටක තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා සියලු පාර්ශවයන් පොදු රාමුවක් තුල මනා සම්බන්ධීකරණයෙන් අධික්ෂණයක් සහිතව ක්‍රියාත්මක විම සිදුකළ යුතුව ඇත.

නියදගල පාසල ,සේව පියස, කර්මාන්ත ශාල, ව්‍යාපාරික ස්ථාන, නිවාස, යන සියලුම ස්ථාන වල මුළු තැන් ගේ සේම, වැසිකිළි පද්ධතිය , අවට පරිසරය ඇතුලත්ව පිළිවෙත් මාලාවක් මගින් සියලු දෙනාගේ සනීපාරක්ෂාව ආරක්ෂා කළ යුතුයි. ඒ සඳහා නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සෑම ආයතනයකම ස්ථාපිතව තිබිම අවශ්‍ය වේ.ඒ තුලින් නිරෝගිමත් දරුපරපුරක්, හොද ශ්‍රම බලකායක්, සතුටින් පිරි ශක්තිමත් පුරවැසියන් පිරිසක් නිර්මානය වනු ඇත..

ඒ අනුව විෂ වායුව සහ වාෂ්ප පරික්ෂාව ඒ සඳහා විසඳුම් ගෙන ඒම, දූවිලි නිවාරණය කිරිම සඳහා අවශ්‍ය වැඩසටහන් සිදුකිරිම , ශබ්ද දූෂනය පාලනය කිරීම, සංසරණය වෙන වාතාශ්‍රය අධික්ෂණය,පොදු ස්ථාන වල වැසිකිලි වල සෞඛ්‍ය ආරක්ෂිත බව, කැළි කසල බැහර කිරීමේ පිළිවෙත් නීරීක්ෂණය ඇතුලු කටයුතු මෙම සැපයුම තුලට ඇතුලත් කළ යුතු වේ

II අභිමතාර්ථ 07 ධරණීය සහ සුනිත්‍ය බලශක්ති

සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමව, තිරසර යටිතල පහසුකම් සහ මූලික සේවා වෙත ප්‍රවේශය සැපයීම, හරිත සහ සුනිසි රැකියා අවශ්‍යතා සුලභ කරමින් සැවොම සඳහා වන ගුණාත්මක ජීවිතයක් ලගා කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ

- ධරණීය බලශක්ති

මෙය දිගුකාලීනව පවත්වාගෙන යා හැකි, පරිසරයට හානියක් නැති සහ සම්පත් අවසන් නොවන ශක්ති ප්‍රභවයන්ය.
වසමේ ධරණීය බලශක්ති ප්‍රභවයක් ලෙස සෝල පැනල් නිෂ්පාදනය පමණක් පවතී.

- සුනිත්‍ය බලශක්ති (Efficient Energy):

මෙය තිබෙන බලශක්තිය උපරිම පරිදි කාර්යක්ෂමව භාවිතා කිරීමයි . අඩු ශක්තියක් භාවිතයෙන් වැඩි ප්‍රතිඵලයක් ලබාගැනීම. වසමේ මුළු පවුල් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් බල ශක්ති පරිභෝජනයේදී සුනිත්‍ය බලශක්ති ක්‍රමවේදයන් උපයෝගි කර ගනි.

උදාහරණ:
- LED බල්බ, solar street lamps
- energy-efficient electrical appliances (5-star ratings)
- smart grids, insulated buildings

- ශක්ති වියදම් අඩු වේ
- පිරිවැය හා ශක්ති අපව්‍යායනය අඩු වේ
- පරිසරයට හිතකාමී ක්‍රම වේ

ධරනීය ශක්තිය = දිගුකාලිනව පවත්වාගත හැකි
සුනිත්‍ය ශක්තිය = කාර්යක්ෂමව, වියදම් සහ ශක්තිය අඩුවෙන් භාවිතා කරන
මෙවැනි බලශක්ති පද්ධති දෙකම එකට යොදාගතහොත්, තිරසාර සංවර්ධනයට උදව් වේ.

III. අභිමතාර්ථ 12 තිරසාර පරිභෝජන හා නිෂ්පාදන රටාවන්

“ආර්ථික ව්‍යවස්ථාව තුළ සම්පත් පරිභෝජනය සහ භාණ්ඩ/සේවාවන් නිෂ්පාදනය පරිසර හිතකාමී, සම්පත් ඉතිරිවන සහ සමාජයට ප්‍රයෝජනවත් ආකාරයකින් සිදු කරන ක්‍රමවේදයන්ය".

පරිසරය ආරක්ෂා කර ගනිමින් සහ ස්වාභාවික සම්පත් තිරසරව කළමනාකරණය කරමින් ආර්ථික සංවර්ධන සහ සමාජ සුභසාධනය දියුණු කිරිම තිරසාර පරිභෝජනයේ හා නිෂ්පාදනයේ අරමුණු වේ.සමාජීය අවශ්‍යතා හදුනාගැනීම ඒවා සපුරාලමින් පරිසර හිතකාමී බව තහවුරු කරමින් කාලීන ආර්ථිකයක් ලගා කර ගැනිම තිරසර සංවර්ධනයේ මූලික අරමුණ

වන අතර ඒ සඳහා තිරසර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිම අත්‍යාවශ්‍ය වේ . අහිතකර පාරිසරික සහ සමාජ බලපෑම සීමාකරමින් නිෂ්පාදනය කෙරන භාන්ඩ හා සේවා සඳහා වෙළඳ පොළ සැකසීම තිරසර පරිභෝජනයේ දී ඉතා වැදගත් වේ

අඩු වරප්‍රසාදිත පිරිස් ඇතුලු සියලු දෙනාගෙම මූලික අවශ්‍යතා වන ආහාර, නිවාස , සෞඛ්‍ය ගමානාගමනය සහ අධ්‍යාපනය ආදී සේවා සැපයිම තුලින් ජීවන තත්ත්වයේ ගුණාත්මක භාවය නංවාලීම සඳහා පරිසර හිතකාමී ලෙස ආර්ථික සංවර්ධන ලගාකර ගැනීමට තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය අවශ්‍ය වේ. මෙහිදී ආර්ථික සංවර්ධන සමග සිදුවිය හැකි පාරිසරික හායනය වෙන් කිරීම ඉතා වැදගත් වේ.

විමෝචනය හා සම්පත් නාස්තිය අවම කරමින් අඩු සම්පත් ප්‍රමානයක් භාවිතා කරමින් වැඩි සමෘද්ධිමත් බවක් ලබා ගැනීම තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය මගින් ඇති කරණු ලබයි. තිරසර පරිභෝජනය හා නිෂ්පාදනය වඩාත් උචිත වන්නේ ආර්ථික සමාජීය හා පාරිසරික ත්‍රිත්ව ජයග්‍රහණයට එය හේතුවන බැවිනි

ප්‍රධාන අරමුණු

1. සම්පත් කාර්යක්ෂම භාවිතය:
- ජලය, විදුලිය, මැටිරියල් අඩු වියදමින් උපරිම ප්‍රතිලාභ
2. ප්‍රතිචක්‍රීකරණය සහ නැවත භාවිතය
- භාවිතා කළ ද්‍රව්‍ය නැවත භාවිත කිරීම
- උදා: ප්ලාස්ටික්, ලෝහ, කාඩ්බෝඩ්

3. හිතකාමී නිෂ්පාදන ක්‍රම:
- පරිසරයට අනිෂ්ටතා අඩු කිරීම
- නිෂ්පාදනේදී විෂාරුද්‍රය, වායු දූෂණය, ජල දූෂණය පාලනය

4. පාරිභෝගික සදාචාරය - පරිසර හිතකාමී භාණ්ඩ තෝරා ගැනීම
- "eco-labels", "organic", "fair trade" වැනි නි

5. නිෂ්පාදන වල ආයු කාලය දිගු කිරීම:
- ගෘහ භාණ්ඩ, වාහන, ඇඟලුම් වැනි දේ දිගුකාලීනව භාවිතයට සුදුසු ලෙස නිෂ්පාදනය
- අලුත්වැඩියාව,

SDG 12 යටතේ, තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය මඟින් පරිසර දූෂණය අඩු කිරීම, සම්පත් ඉතිරිවීම සහ අනාගත පරම්පරාවට සුදුසු ලෝකයක් සකස් කිරීමේ අරමුණ ඇත.

1V අභිමතාර්ථ 13. දේශගුණික විපර්යාස යනු කුමක්ද?

දේශගුණයේ ස්ථිර හැඩතල (, වර්ෂාව, සුළං ආදිය) දිගු කාලයකින් වෙනස් වීමයි.
මෙය ප්‍රධාන වශයෙන් මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවෙයි.
නියදගල වසමේ වී වගාවේ යෙදෙන මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ පැවත අ ා කාළගුණයන් හා දේශගුණයේ ගේ වෙනස්වීම් නිසා වගාවන්ට සිදුවන හානියයි.

අස්වනු නෙලන සමයේ අනපේක්ෂිතව සිදුවන මහ වැසි සහ පැළ හා බීජ සිටුවන කාලයේ සිදුවන අනපේක්ෂිත වියළි කාලගුණය

ප්‍රධාන බලපෑම්:

- වායු උෂ්ණත්වය ඉහළ යාම
- වියළි සමය වැඩිවීම
- ජල හිඟය
- කෘෂිකර්මයට අවාසි
- ජෛව විවිධත්වයට බලපෑම.
- වර්ෂා පටිපැදිවීම් - ගංවතුර
- සත්ව/ශාක වර්ග විනාශය
- ආහාර දාමය බිඳ වැටීම
- රෝග ව්‍යාප්තිය (ඩෙංගු, මලේරියා)
- පිරිසිදු ජලය හා ආහාර ලබාගැනීමේ අපහසුතා

V. අභිමතාර්ථ 14 සාගර සම්පත් සංරක්ෂණය හා පිරිමැසුම් දායක භාවිතාව. අදාල නැත

VI.අභිමතාර්ථ අංක 15- බෞම පරිසර පද්ධතින් සංරක්ෂණය හා තිරසාර භාවිතව

"බෞම පරිසර පද්ධතින් සංරක්ෂණය හා තිරසාර භාවිතය"

--

- නියදගල වසමේ පොදු හිස් අවකාශ ලෙස පවතින ස්ථාන වල රුක් රෝපනය කිරීම
- ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම
- සතුන්ගේ සහ ශාකවල වාසස්ථාන සුරැකිම
- ජලය ,ආහාර ආරක්ෂාව

බෞම පරිසර පද්ධති තිරසාරව භාවිත කිරීමෙන් පසු පරම්පරාවන්ට පරිසරය සුරැකිය හැකිය. මේ සඳහා ප්‍රජාව, රජය සහ පුද්ගලික අංශ එකට ක්‍රියා කළ යුතුය.

8.තිරසාර පරිසර සංවර්ධන හා පරිසර කළමනාකරණය යන්ත්‍රයක් ස්ථාපිත කිරිම සඳහා නව අදහස් යෝජනා නිර්දේශ

රාජ්‍ය හා පෞද්ගලික අංශ එක්ව පරිසරය සුරකීමේ පස් අවුරුදු සැලැස්මක් සකස්කර ඊට අනුකූලව

1.නිෂ්පාදකයාගේ සිට පරිභෝගිකයා දක්වා සැපයුම් දාමයේ ක්‍රියාත්මක වන සියලුම ක්‍රියාධරයන් අතර ක්‍රමික ප්‍රවේශයක් සහ සහයෝගිතාවයක් අවශ්‍ය කරන්නාවූ ව්‍යාපාර, පාරිභෝගිකයින් ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේශකයින්, අලෙවිකරුවන්, මාධ්‍යවේදීන් විවධ පාර්ශවයන් ඊට සම්බන්ධ කරමින් පරිසර හිතකිම් හරිත ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සහ **හරිත** නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිම

2.අපද්‍රව්‍ය පොදු ස්ථාන වලට හා වෙනත් අනවසර ස්ථානවලට බැහර කිරීම වළක්වාලීම සදහා රජයේ නිලධාරීන් මැදිහත් වීම මත නීතිපද්ධතිය බලාත්මක කිරිම

3.පාරිසරික සංරක්ෂණය සදහා නීති හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

4. රසායනික පොහොර හා කෘමිනාශක භාවිතා කිරීමට විකල්පයන් ලෙස පරිසර කාබනික පොහොර භාවිතා කිරීමට ගොවින් දිරිගැන්විම හා ගොවින් උනන්දු කර ලීමේ **වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම

5. ගොඩනැගිලි හා කර්මාන්ත ,මාර්ග ඇතුළු සියළුම ඉදිකිරීම් නියමිත සැලැස්මක්, **ප්‍රමිතීන්ට අනුව** ක්‍රියාත්මක කිරිම

6. ග්‍රාම නිලධාරී වසමේ සැවොම සදහා පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සදහා පිරිසිදු වාතය ලබාගැනීම්මට **වසම තුල ස්වාභාවික වන, වෘක්ෂලතා, සත්ව යන උරුමයන් හායනය වීමට ඉඩ නොදී රැක ගැනිම** සදහා **දැණුවත්වීම් කිරිමේ** වැඩසටහන් ක්‍රියාත්මක කිරිම

7.ප්‍රමිත හා ලේබල් හරහා පාරිභෝගිකයින්ට ප්‍රමාණවත් තොරතුරු සපයමින් තිරසාර පරිභෝජන රටාව පිළිබඳව දැණුවත්වීම් කිරීම

8. ස්වභාවය සම්පත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස උපයෝජනය මගින් වසමේ ආර්ථික සංවර්ධනය මෙහෙයුම්වල තිරසාරභාවය ඉහළ නැංවීම පිනිස නිසි වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

9. පුනර්ජනනීය බලශක්ති උපයෝජනය **හා** ධරනීය සහ සුනිත්‍ය බලශක්ති **පිළිබඳව දැණුවත් කිරිම** සහ රාජ්‍ය මැදිහත්වීම මගින් ව්‍යාපෘති ආරම්භ කිරීම සදහා මූල්‍යාධාර ලබා දීම හරිත සහ සුනිසි රැකියා අවශ්‍යතා සුලභ **කිරීම** සහ බලශක්ති පරිභෝජනය අඩුකරණ ක්‍රියාවලින් භාවිතා කිරීම

10.ව්‍යාපාර සහ සමාජ ව්‍යවසායන්හි සිට අවධානමට ලක් විය හැකි ප්‍රජාවන් සවිබල ගන්වන සංයුක්ත ව්‍යාපාර ආකෘති දක්වා විහිදුනු ආකාරයේ නිවැරැදි පරිසර පද්ධති වල සහය ඇතිව නිවැරැදි ක්‍රම වේදය මත ව්‍යාපාර වල වර්ධනය වීමට කටයුතු කිරිමේ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම

11. clean ශ්‍රී ලංකා ව්‍යාපෘතිය යටතේ කසල කළමනාකරණය පිළිබඳව ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවත්විම

12.. විථි පවිත්‍රකරණය සදහා ප්‍රජා සහභාගිත්වය දායක කර ගැනිම සදහා **වැඩසටහන්** ක්‍රියාත්මක කිරීම

13. පරිසර පද්ධති අඛණ්ඩතාව පවත්වා ගැනීම සදහා ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමෙන් පාරිසරික පද්ධතිවල සෞඛ්‍ය පවත්වා ගැනීම

14. සමාජ වර්ගීකීම් ඉවුකරලීම සදහා, ප්‍රදේශයේ ප්‍රජාවන් සහ අයාතන සම්බන්ධීකරණය මගින් පාරාර්ථකාමී සමාජ ක්‍රියාකාරකම් ඉටුකරලීම

15. නවෝත්පාදන මගින් පරිසර සම්පත් කළමනාකරණය කිරීමට සහ සංරක්ෂණය කිරීමට හැකියාවන් වර්ධනය කිරීමේ සැලසුම් සකස් කිරිම හා ක්‍රියාත්මක කිරිම. පාරිසරික සම්පත් නාස්තිය අවම කිරිම සහ සීමිත

සම්පත් සංරක්ෂණය කිරිම සදහා ජලය, බලශක්තිය සහ අමුද්‍රව්‍ය වැනි සම්පත් වඩාත් කාර්‍යක්ෂමව භාවිතා කිරීම පිළිබඳව දැණුවත්වීම් කිරීම

16.අපද්‍රව්‍ය කළමනාකරණය තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම. අපද්‍රව්‍ය සහ විමෝචනයන් නිර්මානය කිරීමෙන් පසු කළමනාකරණය කිරිම වෙනුවට ප්‍රභවයේදීම අඩු කිරිම.අපද්‍රව්‍ය වටිනාකමක් ලබාගැනීමට දියුණු ප්‍රතිචක්‍රිකරණය සහ අපද්‍රව්‍ය බලශක්ති පද්ධතිය සංවර්ධන කිරිම

17.ස්මාර්ට් කෘෂිකාර්මය ප්‍රවල්ත කිරීම. එනම් කෘෂිකාර්මික පිළිවෙත් වඩාත් කාර්‍යක්ෂමව කළමනාකරණය කිරීම සදහා දත්ත සහ තාක්ෂණය භාවිතා කිරීම **මගින්** ජල භාවිතය සහ රසායනික භාවිතය අඩුකිරිම

18.අධ්‍යාපන වැඩසටහන් මගින් පරිසර භාරකත්වය හා ආරක්ෂාව නව පරපුරට පැවරීමේ වගකීම ලබාදිම